# රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
# පුරප්පාඩු - 2026

වාණිජ මුද්‍රණ, ආරක්ෂක මුද්‍රණ, ප්‍රකාශන සහ ලිපිද්‍රව්‍ය නිෂ්පාදනය සහ අලෙවිකරණ ක්ෂේත්‍රයේ නියැලී සිටින, මනාව ස්ථාපිත ලාභ ලබන වාණිජ සංවිධානයක් වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පහත සඳහන් පුරප්පාඩු සඳහා මනා සේවා වාර්තාවක් සහිත, කාර්යශූර සහ ප්‍රතිඵල මත පදනම් වූ ශ්‍රී ලාංකිකයින්ගෙන් අයදුම්පත් කැඳවයි.

## 01. කළමනාකාර (ඉංජිනේරු) තනතුර - (HM 1-1) (තනතුරු 01 යි)

**රැකියා විස්තරය**

ආයතනික කාර්යසාධන දර්ශක (KPIs) සාක්ෂාත් කර ගැනීම සඳහා ඉංජිනේරු/නඩත්තු දෙපාර්තමේන්තුවට නායකත්වය දීම සහ වැඩිදියුණු කිරීම, තාක්ෂණික කණ්ඩායම් අධීක්ෂණය කිරීම, නිවාරණ නඩත්තු සහ තත්ත්ව පද්ධති ක්‍රියාත්මක කිරීම, ඉංජිනේරු යටිතල පහසුකම් කළමනාකරණය කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සහ උපකරණවල විශ්වසනීයත්වය හා නිෂ්පාදන ඉලක්ක සපුරා ඇති බව සහතික කිරීම සඳහා නිෂ්පාදන සැලසුම් අංශය සමඟ සම්බන්ධීකරණයෙන් කටයුතු කිරීම.

**සුදුසුකම්: අධ්‍යාපනික**

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව හෝ විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ප්‍රථම උපාධියක්.

**සමඟ**

ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී ඇති සහ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (IESL) ආයතනික සාමාජිකත්වයක් තිබීම..

**සහ**

ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු ඊට අදාළ ක්ෂේත්‍රයක රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" අවම වශයෙන් වසර 13ක පළපුරුද්ද.

**හෝ**

2. පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (IESL) පූර්ණ/අධි සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

**සහ**

රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" අවම වශයෙන් වසර 13ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයෙහි කළමනාකාර කාණ්ඩයේ (MM) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර තුනක (03) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු කවුන්සිලයේ (ECSL) වරලත් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී ඇති සහ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක (IESL) වරලත් සාමාජිකත්වයක් තිබීම.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස් සීමාව:**

වයස අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:**

2027.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි HM 1-1 2025 (2025.03.25 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2025 ට අනුව).

| කළමනාකාර (ඉංජිනේරු) තනතුර - ( HM 1-1 ) | |
|---|---|
| 2026.01.01 | 2027.01.01 |
| රු. 123,019/- | රු. 140,640/- |

- **සේවා කොන්දේසි:**

  ඉහත තනතුර ස්ථිර වන අතර වසර තුනක (03) පරිවාස කාලයකට යටත් විය යුතුය. පෙර තනතුරෙහි ස්ථිර කර ඇති, අභ්‍යන්තරව තෝරාගනු ලබන සේවකයෙකු වසරක (01) වැඩබැලීමේ කාලයකට යටත් වනු ඇත.

**දීමනා:**

වැටුපට අමතරව මෙම තනතුර සඳහා පහත සඳහන් දීමනා අදාළ වේ.

- චක්‍රලේඛවලට අනුව රජය විසින් අනුමත කරන ලද දීමනා.
- පැමිණීමේ දිරිගැන්වීමේ දීමනාව.
- ආහාර දීමනාව.

**වෙනත් ආන්තික ප්‍රතිලාභ:**

- සේවකයා සහ පවුල ආවරණය වන වෛද්‍ය යෝජනා ක්‍රමය.
- KPI (කාර්යසාධන දර්ශක) මත පදනම් වූ දිරිගැන්වීමේ ක්‍රමය.
- සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF).
- ප්‍රයෝජනයට නොගත් නිවාඩු මුදල් බවට පත් කිරීම.

## 02. ව්‍යාපෘති කළමනාකාර තනතුර (කොන්ත්‍රාත් පදනම මත) (තනතුරු 01 යි)

**රැකියා විස්තරය:**

අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් සමඟ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම, රැස්වීම් සහ ප්‍රගති සමාලෝචන සංවිධානය කිරීම, KPI සහ ඵලදායිතා මූලපිරීම් ක්‍රියාත්මක කිරීම, ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම, සහ ඊට සමගාමීව ERP පද්ධති ස්ථාපිත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සහාය වීම.

**සුදුසුකම්: අධ්‍යාපනික**

**බාහිර අයදුම්කරුවන්: (පහත 1 හෝ 2)**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය හෝ තනතුරට අදාළ වෙනත් ඕනෑම උපාධි විෂය ක්ෂේත්‍රයක් පිළිබඳ ප්‍රථම උපාධියක්.

**සමඟ**

2. ව්‍යාපෘති කළමනාකරණය හෝ ඊට අදාළ ක්ෂේත්‍රයක් පිළිබඳ අවම වශයෙන් එක් (01) වසරක පශ්චාත්-සුදුසුකම් පළපුරුද්ද.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**වයස් සීමාව:** වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය:** රු. 99,510/- (සියලුම දීමනා සමඟ).

**කාලසීමාව:** වසර 01 ක කොන්ත්‍රාත් කාලයක් සඳහා.

**අයදුම් කරන ආකාරය:**

**2026.11.10** දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, සිය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කරන සහතිකපත්වල සහ උප්පැන්න සහතිකයේ **සහතික කළ පිටපත්** සමඟ තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කරුණුවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. රජයේ / රාජ්‍ය ආයතනවල / සංස්ථාවල / මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අදාළ ආයතන ප්‍රධානීන් හරහා අයදුම්පත් යොමු කළ යුතුය.

**අයදුම් කරන තනතුර අයදුම්පත අඩංගු ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.**

**එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.**

සියලුම අයදුම්පත් 2026.11.10 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "සභාපති, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පානළුව, පාදුක්ක" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යැවීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කළ යුතුය.

**ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

- මෙහි සඳහන් නොවන කරුණක් ඇත්නම්, ඒ පිළිබඳව බඳවා ගැනීමේ නිසි බලධාරියා විසින් තීරණය කරනු ඇත. කුමන අයුරකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**සභාපති,**
**රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,**
**පානළුව, පාදුක්ක.**

SPC